" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/22-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2021/12/23

## මූල්‍ය චක්‍රලේඛ අංක 13/2021

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ,

සභා ලේකම් (බ.ප.),

සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් (බ.ප.),

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් (බ.ප.),

සියලුම අධිකාරිවල සභාපතිවරුන් (බ.ප.),

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් (බ.ප).

**2020.12.31 දින දක්වා මූල්‍ය නොවන වත්කම් CIGAS වැඩසටහනට ගිණුම්ගත කිරීම**

17/2019 , 17/2019(i) හා 10/2020 මූල්‍ය චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමු කරවමි.

**02.** **2020.12.31** දින දක්වා මූල්‍ය නොවන වත්කම් දැනටමත් එක් එක් ආයතන විසින් ඉහත චක්‍රලේඛ අනුව Excel සටහන් වලට ඇතුලත් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත.

**03.** එම මූල්‍ය නොවන වත්කම් නව සිගාස් ( New CIGAS ) වැඩසටහනට ද ඇතුලත් කල යුතු වේ.

1. ඒ අනුව බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ https://fin.chiefsec.wp.gov.lk වෙබ් අඩවියෙන් නව සිගාස් වැඩසටහනෙහි ස්ථාපනය කිරීමේ ගොනුව පහත පරිදි බාගත (Download) කර ස්ථාපනය කළ යුතුය.

**https://fin.chiefsec.wp.gov.lk ⟶ View in English ⟶ Downloads ⟶ CIGAS Update ⟶ New CIGAS Installation File 2021.02.16**

2. එම ස්ථාපනය කරන ලද නව සිගාස් වැඩසටහනට ප්‍රධාන ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ අවසන්වරට උඩුගත කර ඇති සිගාස් යාවත්කාලීන කිරීමේ ගොනුවද (New Cigas Update) පහත පරිදි බාගත (Download) කර ඇතුළත් කළ යුතුය.

**https://fin.chiefsec.wp.gov.lk ⟶ View in English ⟶ Downloads ⟶ CIGAS Update ⟶ New Cigas Update 7.2.0.1 - 2021.12.13**

3. දැනට ගිණුම් කටයුතු සඳහා භාවිතා කරන සිගාස් වැඩසටහනෙහි 2021 නොවැම්බර් මස උපස්ථ ගොනුව (Backup File) නව ස්ථාපිත සිගාස් වැඩසටහනට ඇතුළත් කළ යුතුය.

4. එම නව ස්ථාපිත සිගාස් වැඩසටහනෙහි වත්කම් කළමණාකරන පැකේජය ක්‍රියාත්මක කිරීම, මූල්‍ය නොවන වත්කම් සිගාස් (CIGAS) වැඩසටහනට ඇතුළත් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනේදී දැනුවත් කල පරිදි සිදු කළ යුතුය.

**ඒ සඳහා පහත ලබා දී ඇති ක්‍රියාත්මක කිරීමේ කේතය (Activation Code) 2021.12.29 දින කාර්යාල වේලාව තුල පමණක් වලංගු වන අතර එදිනම එම ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.**

**කේතය - 2592**

5. අවසන් පියවර ලෙස වත්කම්වලට අදාල උප අයිතම අංක සිගාස් වැඩසටහනට ඇතුලත් කිරීමට සිගාස් යාවත්කාලීන කිරීමේ ගොනුවද (New Cigas Update) පහත පරිදි බාගත (Download) කර ඇතුළත් කළ යුතුය

**https://fin.chiefsec.wp.gov.lk ⟶ View in English ⟶ Downloads ⟶ CIGAS Update ⟶ New Cigas Update For Asset**

**04.** ඉහත පියවර අනුගමනය කරමින් නව ස්ථාපිත සිගාස් වැඩසටහනේ වත්කම් කළමනාකරණ යෙදුම ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව **2020.12.31** දින දක්වා ඔබ විසින් භාණ්ඩාගාරයට වාර්තා කර ඇති මූල්‍ය නොවන වත්කම් **ආරම්භක ශේෂ** ලෙස එම වැඩසටහනට ඇතුලත් කළ යුතුය.

**05.** ඒ අනුව මූල්‍ය නොවන වත්කම් එම සිගාස් වැඩසටහනට ඇතුලත් කිරීමේදී වත්කම් වලට අදාල උප අයිතම අංක වැඩසටහනෙහි නොමැති නම් එම වත්කමට අදාල තොරතුරු භාණ්ඩාගාරයට දන්වා නව අයිතම අංක ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

**06.** **2020.12.31 දින දක්වා මූල්‍ය නොවන වත්කම් දැනටමත් Excel සටහන් වලට ඇතුලත් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇති අතර එම වත්කම් වර්ගීකරණයේ හෝ වටිනාකම් වල නිවැරදි කිරීම් සිදුවිය යුතු වේ නම් එම නිවැරදි කිරීම් සිදුකර නව සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීම සිදු කළ යුතුය.**

**07.** **ඒ අනුව සිගාස් වැඩසටහනට සියලු වත්කම් ඇතුලත් කිරීමෙන් පසු එක් එක් වත්කම් වර්ගීකරණයේ මුලු එකතු අගයන් හා භාණ්ඩාගාරය මගින් ඉදිරිපත් කර ඇති සැසඳීම් ප්‍රකාශවල 2020.12.31 දක්වා වත්කම් අගයන් ගැලපිය යුතුය.** එසේ නොගැලපෙන කාර්යාල වේ නම් එම නොගැලපීමට හේතුව සඳහන් කර එම අගයන් නිවැරදි කිරීමට අදාළ තොරතුරු කඩිනමින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු බව දන්වා සිටිමි .

**08.** තවද මාගේ අංක -CSWP/FIN-BK/03/FI/02-2020 හා 2021.11.16 දිනැති ලිපියෙහි ඇමුණුම 01 හි සඳහන් කාර්යාලද **2019.12.31** දින දක්වා මූල්‍ය නොවන වත්කම් සිගාස් වැඩසටහනට ඇතුලත් කළ යුතු වේ.

**09.** සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලද **2020.12.31** දින දක්වා බස්නාහිර පළාත් සභාවට අයත් මූල්‍ය නොවන වත්කම් ඉහත 03 ඡේදයේ උපදෙස් අනුව නව ස්ථාපිත සිගාස් වැඩසටහනට ඇතුලත් කළ යුතු බව දන්වා සිටිමි.

**10.** මෙම සියලු තොරතුරු 2022 පෙබරවාරි මස 07 වන දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**11.** 2021 වර්ෂයට අදාල මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සඳහා උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්
බස්නාහිර පළාත.

පිටපත් -:

1. විගණකාධිපති
2. ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
3. සභාපති මුදල් කොමිෂන් සභාව
4. සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
5. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන / අයවැය / ආදායම්)
6. ගණකාධිකාරී (ගෙවීම්).